# ක්‍රිස්ටිගේ අභිරහස් ගමන



කේ. ඒ. පවනි තීක්ෂණා දේවප්‍රිය

# ක්‍රිස්ටිගේ අභිරහස් ගමන

කේ. ඒ. පවනි තීක්ෂණා දේවප්‍රිය

කතෘ

කතෘගේ වෙනත් කෘති: **පැංචයි පිංචියි**

මහ/ මහමායා බාලිකා විද්‍යාලය

7 ශ්‍රේණිය D

2026 මැයි මස 10

ISBN No: 978-624-211-274-9

# පිදුම

*අම්මාටයි තාත්තාටයි*

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. ලියවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ  මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟ පෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධිර<br>
විදුහල්පතිනිය<br>
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

එදා වැසිබර දිනකි. ක්‍රිස්ටි ගෙදරින් එළියට බැස්සා. සෙල්ලම් කරන්න කියලා හිතාගෙන. ගොරවන්න පටන් ගත්තා. අකුණු ගසන්නත් පටන් ගත්තා. අපි එළියට ගිය නිසා අම්මා කතා කරා ඉක්මනින් එන්න වහිනවානේ අම්මා කිව්වා.

ඔයාලා තාම දවල්ට කෑවෙත් නෑනේ. කාලා ඉන්න ඇවිල්ලා දැන් කීයද වෙලාව. ගොඩක් හවස් වෙලා. අම්මා අපිට කෑම කන්න කිව්වා. දැන් හතරටත්

ලඟයි. තාත්තත් එයි. ඔයාලා වැස්සේ එළියට වෙලා හිටියොත් තාත්තා හොඳටම බනියි කියලා අම්මා කිව්වා. එවිටම වගේ තාත්තා ගෙදර ආවා. මම දුවගෙන දොර ළඟට ගියා. අද මොනාද තාත්තා මට ගෙනාවේ කියලා ක්‍රිස්ටි ඇහුවා. අද මම ක්‍රිස්ටි දුවට ලස්සන කතන්දර පොතක් ගෙනාවා. තාත්තා කිව්වා.

ඒකේ නම තමා වීර දුව. මගේ දුව වගේ වීර දුවෙක් ගැන තමයි ඒකෙ කියන්නෙ. ඒක නිසා මං ඒ පොත ගෙනාවා. ක්‍රිස්ටි ගොඩක් සතුටු වුණා. ඇයට දැන් මෙම පොත කියවනකම් ඉවසිල්ලක් නෑ. ක්‍රිස්ටි

රැයක් දවාලක් නැතුව මෙම පොත කියවන්න පටන් ගත්තා.

ඇය දින දෙකක් තුළ මෙම පොත කියවා නිම කරා. ඇයට මෙම වීර කතාව කියවන අතරතුර ලොකු ආසාවක් ඇති වුණා. අභිරහස් තොරතුරු හොයන්නට. ඇය කල්පනා කරමින් සිටියා රැය පහන් වන තුරුම අභිරහස් තොරතුරු සොයා යන්නේ කෙසේද කියා. පසුවදා රාත්‍රිය ආහාර වේල ගැනීමට සියලු දෙනා කෑම මේසයේ වාඩි වුනා.

ක්‍රිස්ටි නොසන්සුන් බවකින් පසුවූ බැවින් අම්මයි තාත්තයි ඇසුවා ඇයි දුවේ ඔයා ප්‍රශ්නයකද ඉන්නේ කියලා. අනේ නෑ අම්මේ මං හරිම ආසයි අභිරහස් දේවල් ගැන හොයන්න කියලා කිව්වා. අනේ මගේ ක්‍රිස්ටි පැටියා තාම පොඩි වැඩීනේ ඕවට කියලා තාත්තා කිව්වා. ඒකට ක්‍රිස්ටිට තරහ ගියා. ඉන් පසුව ඇය කෑම ගැනීමත් නතර කොට කෝපයෙන් කෑම මේසයෙන් නැගිට වේගයෙන් කාමරයට යාමට පිටවුණා. ඇය කෝපයෙන් සහ වේගයෙන් ගිය නිසා ඇගේ කකුල වැදී අසුරා තිබූ පෙට්ටගමක් බිමට වැටුනා.

ඒ පෙට්ටගම ඇතුලේ සිතියම් ගොඩක් තිබුනා. එම සිතියම් වලින් ගොඩක් පරණ සිතියමක් තිබී ක්‍රිස්ටි

එය අතට ගත්තා. ඉන්පසු ඇය එම සිතියම හොඳින් පරීක්ෂා කරන්න පටන් ගත්තා. අබිරහස් සෙවීමට තිබූ ආශාව නිසාම ඇය මෙම සිතියමේ තිබූ හැමදේම හොඳින් අධ්‍යයනය කරා.ඒ සිතියමේ තිබූ අභිරහස සොයා යෑමට ඇය තීරණය කළා.

ඉන්පසු ඇය එදා රෑම බඩු ලෑස්ති කරගත්තා. මාලිමාවක්, කෑම ටිකක්, ඇඳුම්, වතුර වැනි දෑ බෑග් එකට දමාගෙන සූදානම් වුණා. ඇයට අවසරයක් නොලැබෙන නිසා දෙමව්පියන්ට නොකියාම ඇය ගමන යාමට තීරණය කළා. නමුත් කවුරු හරි වැඩිහිටියෙකු දැනුවත් කළ යුතු නිසා ආච්චි අම්මාට කෙටියෙන් පවසා ඇය පිටත් වුණා.

ඇය සිතියම දිගහැර යන මාර්ගය නිවැරදි දැයි බැලුවා. සිතියම උඩින් මාලිමාව තබා උතුරු දිශාවේ තමයි සිතියමේ කතිරේ ලකුණු කරලා තිබුණේ. ක්‍රිස්ටි නැව් නවත්තලා තියෙන තැනකට ගියා. උතුරු දිශාවට යන නැවක් ඇයට හම්බවුණා. නැවට නැග්ගා. ඇය දැක්කා නැවේ දුප්පත් ගැහැණු ළමයෙක්. ඇය ගැහැණු ළමයා ළඟට ගිහින් ඇහුවා ඔයාගේ නම මොකක්ද කියලා. මගේ නම ඈන් ඇය කිව්වා.

ඇය සමග කතා කරගෙන යන විට මට පැහැදිලි වුනේ ඇයද අභිරහස් සොයා ගැනීමට කැමති බවයි.



ඇයගේ කැමැත්ත නිසාම ක්‍රිස්ටි ඇයගේ ගමනට එකතුවෙන්න කැමතිද කියා ඈන්ගෙන් ඇසුවා. ඇය කැමැත්ත පළ කළා. ඈන් මම ඔයාට අපේ ගමනට අඳින්න පුළුවන් ඇඳුමක් දෙන්නම්. ආ මෙන්න මේ ඇඳුම ඇඳගන්න. ඔයාට ගානටම තියෙයි.

ක්‍රිස්ටි සහ ඈන් නොයෙකුත් බාධක මැදින් දවස් හතක් තිස්සේ සිතියමේ එයාලට අවශ්‍ය තැනට ළඟා වුණා. එයලා නගරයක් මැදින් යන විට ඉතා පෝසත් ගැහැණු ළමයෙක් පාර අයිනේ අඬ අඬ ඉන්නවා දැක්කා. ක්‍රිස්ටි ඇහුවා ඇයි ඔයා අඬන්නේ කියලා. ඇය කිව්වා. යන්න පාර හොයාගන්න බැරුව ඉන්නෙ කියලා. හරි අපි හොයාගමු පාර. හැබැයි අපේ ගමනට ඔයත් එකතු වුනොත් ඔයාට අපි උදව් කරන්නම්. ක්‍රිස්ටි කිව්වා.

අපි යන්නෙ අභිරහසක් හොයාගෙන. ඔයාට පුළුවන්ද අපිට උදව් කරන්න ඔයාගේ නම මොකක්ද. මගේ නම ජෝර්ජිනා. හරි ජෝර්ජිනා එහෙනම් ඔයත් අපිත් එක්ක යමු.

දැන් අපිට ඉදිරියට යන්න නම් මේ ගඟෙන් එගොඩ වෙන්නම වෙනවා. දැන් අපිට ඔරුවක් අවශ්‍ය වෙනවා. එහෙනම් අපි යමු ගඟ පැත්තට. ඔරුවක් ඒ අවට කොහේ හරි ඇති. හා යමු ඈන් කිව්වා.

ඇති යන්තම් අපි ගඟ අයිනට ආවා කවුරු හරි අතෑරලා දාලා ගිය ඔරුවක් අපට හම්බවුණා. පොඩ්ඩක් කැඩිලා තියෙන්නේ. අපි පොඩ්ඩක් ඒක හදාගෙන ඉක්මනින් යමු. අපි ඔරුවෙන් යන්න පටන් ගත්තා. ඒ අතරතුර නොයෙකුත් බාධක මැද යන විට තද හුළඟක් හමන්න පටන් ගත්තා. එයාලට ඔරුව පාලනය කරගන්න අපහසු වුණා. එයාලගේ ඔරුව කැඩුණු තැනින් වතුර එන්න පටන් ගත්තා. ඉන්පසු තුන්දෙනා අත් අල්ලගෙන ප්‍රාර්ථනා කළා. පෘථිවි මාතාවනි අපව හරි පාරට යවන්න කියලා.

එයාලා උඩ ඇස් ඇරලා බලද්දි එයාලා ගල් වලින් වටවුන දූපතක හිටියා. ක්‍රිස්ටි ට අදහගන්න බැරි උනා. අපි ආවා අන්තිමට. ඈන් සහ ජෝර්ජිනා ඇයි ඇයි අපි හරිම තැනට ඇවිත් ඉන්නේ ඔයා කලබල වෙන්න එපා කියලා ක්‍රිස්ටි ට කිව්වා. අපි දැන් හොයා ගමු නිධානය තියෙන්නේ හරියටම කොතනද කියලා.

කැලේ යනකොට මෙයාලා ළඟට කළු වලහෙක් ආවා. හරි පුදුමයි මේ වලහට කතා කරන්න පුළුවන්. ඔයා ක්‍රිස්ටි නේද කියලා වලහා ඇහුවා. පුදුමයට පත්වුනට ක්‍රිස්ටි ඔයා කොහොමද අපිව දන්නේ කියලා ඇහුවා. ඔයාලා එන බව මම දන්නවා ඒකයි මං මග බලාගෙන හිටියේ කියලා වලහා කිව්වා. ඔයාලට මං

ඉඟියක් දෙන්නම් මෙතන අර පේන තඩි ගල්තලාවට උඩින් ගිහිල්ලා පහලට බහින්න. ඔයාලට ඉක්මනටම නිධානය හොයාගන්න හම්බවෙයි. මං ගිහිල්ලා එන්නම් කියලා වලහා නොපෙනී ගියා.

ඒ කියන්නේ අපි දැන් ගොඩක් ළං වෙලා ඉන්නේ මම ජෝර්ජිනා ට කිව්වා. ඇයත් පුදුමයෙන් බැලුවා. මම මේ පැත්තට යන්නම්. ඈන් අර පැත්තට යන්න ජෝර්ජිනා අනිත් පැත්තට යන්න. ඔයාලට මොනවාහරි හම්බුනොත් තැන මතක තියං ආපහු මෙතනටම එන්න.

පැය දෙකක් පමණ ගතවුණා ක්‍රිස්ටි සහ ජෝර්ජිනා හිටපු තැනට ආවා. නමුත් ඈන් තාම පැමිණියේ නැහැ. කෝ මේ ඈන්. එවිටම ඈන්ගේ කටහඬ ඇහුණා. යාළුවනේ මෙහෙට එන්න ඉක්මනට එන්න. එ ඈන්ගේ හඬයි. ක්‍රිස්ටි සහ ජෝර්ජිනා වේගයෙන් කටහඬ ඇහුණු පැත්තට දිව්වා. පුදුමයක්.

මොකක්ද මොකක්ද මේ බලන්න අපිට නිධානය හම්බ වුණා. හැංගුණු ලස්සන පාරාදීසයක්. එක් දිය ඇල්ලක් ඉර අව්වට දිලිසෙනවා රිදී පාටින්. පලතුරු මල් හැම තැනම පිරිලා. ක්‍රිස්ටි එයාගේ බෑග් එකෙන් කැමරාව අරගෙන පින්තූර ගත්තා. අද අපි මෙහේ නවතිමු.



ඇන් සහ ජෝර්ජිනා ද එයට කැමැත්ත පළ කළා. රෑට කන්න පලතුරු ටිකක් අරන් එන්න ඇන් ගියා. ජෝර්ජිනා සහ ක්‍රිස්ටි එකතු වී ගසක් උඩ පැලක් වගේ හදාගත්තා.

එයාලට අද රෑ නතර වෙන්න. හවස් වේගෙන එන විට තුන්දෙනාම එම පැල ඇතුලට වෙලා පලතුරු කන ගමන් මෙසේ කතා වුණා. හෙට උදෙන්ම අපි ගෙදර යමු. අපේ අම්මලා බය වෙලා ඇති. අපි යනකොට අර කළු වලහට පලතුරු කූඩයකුත් දීලා යමු. ක්‍රිස්ටි කිව්වා.

අපි දැන් තැන හොයා ගත්තනේ. අපි අම්මලා තාත්තලත් එක්ක මේ ගමන එමු. පහුවදා උදේ එයාලා ගෙවල් වලට යාමට පිටත් වුණා. යන අතරතුර කළු වලහා ආයේ හමු වුණා. ඔයාලා යනවද... ඔයාලා යනවද... කෝ එතන හිටපු ළමයව බේරගත්තේ නැද්ද. අපිට හොයාගන්න බැරි වුණා. මොකටද අපි මෙතෙන්ට ආවේ කියලා අපිට අමතක උනා.

වලහත් සමග නැවත හිටපු තැනටම අපි ආවා. ක්‍රිස්ටිලා වලහාගෙත් උදව්වෙන් එතන සැඟවී සිටි අහිංසක ගෑණු ළමයෙකු හොයා ගත්තා. නිධානය ලග බෙනයක හිර වී සිටි අන්ජුනා බේරගත්තා. එයාගේ

ගෙදර අයට බාර දෙමු. නැවත යාමට අපිව ඔරුව ළඟට වලස් රාල ගෙනත් දැම්මා.

පලතුරු කූඩය වලස් රාළටදී ස්තූති කොට අපි ඔරුවට නැගලා ගමන යාමට පිටත් වුණා. ඔයාලට සුබ ගමන් කියා වලහා නොපෙනි ගියා. ජෝර්ජිනා ගෙදර යාමට අවශ්‍ය බව කීවා. ඇයගේ අම්මයි තාත්තයි ඇයව සොයමින් සිටියා. මෙයාලා යන අතරමගදී ජෝර්ජනාගේ මව මෙහෙකාර සේවයේ යෙදී සිටියදී ජෝර්ජිනාව භාරදී අපි ගෙදර යාමට පිටත් වුණා.

කෙසේ හෝ ක්‍රිස්ටි ගෙදරට පැමිණියා. අම්මයි තාත්තයි හැම තැනම හොයමින් සිටින විට ඇගේ පැමිණීම ගැන අම්මලා සතුටු උනා. අත්තම්මාට ස්තුති කලා. ක්‍රිස්ටිගේ පියා විසින් ඈන්ව ඇගේ ගෙදරට බාර දුන්නා.

නමුත් අන්ජුනාට යාමට නිවසක් තිබුනේ නැත. ඇගේ දෙමාපියන් නෑදෑයන් මියගොස් තිබුණා. ක්‍රිස්ටි ඇයව ඇගේ ගෙදර නවතා ගත්තා. ඇගේ සහෝදරියකට මෙන් සලකා සතුටින් ජීවත් වුණා. ක්‍රිස්ටි කෑම මේසයේ දී අම්මට තාත්තාට මෙම අභිරහස් කතාව පැහැදිලි කර දුන්නා. වීර ක්‍රිස්ටි ගැන සතුටු වුනු පියා නැවත එවැනි ගමන් නොයන ලෙසද අවවාද දුන්නා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය. තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොත පතින් දරුවන් දුරස්වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධ මේ  වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේම මාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය දියත් වෙයි පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත්  යුගයේ අවශ්‍යතාවයක් වන  කාන්තාව සවි බල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේම මාලා කුමරියට දැක්වීමද මෙහි මූලික අරමුණයි. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, , විදුහල්පතිනිය,  ගුරු, භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම  සද් කාර්යය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

ව්‍යාපෘති නිර්මාතෘ

ISBN No: 978-624-211-274-9